ජාතික නිදහස් පෙරමුණ
தேசிய சுதந்திர முன்னணி
National Freedom Front

විශේෂ මාධ්‍ය නිවේදනය

# ජනවරම නිවැරදිව කියවා ගැනීමේ වැදගත්කම

ජනාධිපතිවරණයේ දී ජාතික ජන බලවේගය ලබාගත් ජනවරමේ දිගුවක් ලෙස ජනතාව විසින් එම ජනවරම තවදුරටත් ශක්තිමත් කරමින් පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඓතිහාසිකව සුවිශේෂී ජනවරමක් ලබාදී ඇත. එම ජනවරම හිසට බරක් වන බව සහ එය අවභාවිතා නොකරන බව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතා විසින් සඳහන් කිරීම අපි අගය කරමු. එම ජනවරමට ගරු කරන බව සහ ඊට එරෙහිව ක්‍රියා කිරීමට කටයුතු නොකරන බව මෙන්ම එය ආරක්ෂා කරන බව සහ ආණ්ඩුව ඊට එරෙහිව ක්‍රියාකිරීම වැළැක්වීම අපගේ ඉදිරි දේශපාලන භූමිකාව බව අප විසින් දැනටමත් මහජනයාට දන්වා ඇත.

ඒ අනුව මෙම ජනවරම නිවැරදිව කියවා ගැනීම හෙවත් එය නිර්මාණය කළ ජනතාවගේ හදවත්වල තැන්පත් වී ඇති දීර්ඝ කාලීන අපේක්ෂා පිළිබඳව ආණ්ඩුව මෙන්ම මහජනයා ලෙස අප සැම ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. එදා 2002 දී දෙමළ බෙදුම්වාදීන්ට තාවකාලික ආණ්ඩුවක් ලබාදී ඊළම නිර්මාණය කිරීමට කෙටි පාරක් කැපීමට දායක වූ රනිල් වික්‍රමසිංහ පරාජය කිරීමට මෙන්ම ඉන්පසුව 2004 පාර්ලිමේන්තු මැතිවරණයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ තරග කළ ජනතා විමුක්ති පෙරමුණේ සියලුම අපේක්ෂකයන්ට ඉහළම මනාප ලබාදුන්නේ අද ආණ්ඩුවේ ජනවරම නිර්මාණය කළ ජනතාවම බව අපගේ කියවා ගැනීම වේ. එදා ජාතික ජන බලවේගයක් තිබුණේ නැත. ඉන්පසුව 2005 දී මහින්ද රාජපක්ෂ බලයට පත්කර යුද්ධය අවසන් කිරීම සඳහා ඡන්දය දුන්නේ එම ජනතාවම නොවේ ද?. බෙදුම්වාදී යුද්ධය පරාජය කිරීමෙන් පසුව නැවතත් රට ගොඩනැඟීමට ජනවරම නිර්මාණය කළේ ද ඔවුන්ම ය.

එසේම යුද්ධය අවසන් කිරීමෙන් පසුව උතුරේ සහ දකුණේ ජනතාව අතර "මානසික පාලම" ඉදිකිරීම මගින් බෙදුම්වාදය සහ ජාතිවාදය පරාජය කිරීම වෙනුවට "කොන්ක්‍රීට් පාලම්" ඉදිකර කොමිස් ගැසීමේ බැසිල් රාජපක්ෂ න්‍යාය ප්‍රතික්ෂේප කිරීමේ ජනවරම නිර්මාණය කිරීමට ද එම සුවිශේෂී ජන කණ්ඩායම දායක විය. ඉන් පසුව 2015 - 2019 කාලයේදී නැවත වටයකින් රනිල් වික්‍රමසිංහ පාලනය විසින් නිර්මාණය කළ අර්බුද විසඳීම සඳහා ගෝඨාභය රාජපක්ෂට ලබාදුන් 69 ලක්ෂයක ජනවරම නිර්මාණය කරන්නේ ද අද අනුර දිසානායක ජනාධිපතිවරයාගේ 69 ලක්ෂයක ජනවරමට දායක වූ අතිබහුතරයකි.

එම දීර්ඝ ඉතිහාස කතාව වැදගත් වන්නේ අප රටේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාවය සහ ඓතිහාසික සභ්‍යත්ව උරුමය ආරක්ෂා කිරීම සඳහා කැපවෙන සහ නිර්භීතව දේශපාලන තීන්දු ගන්නා ලක්ෂ 60 - 70 ක ඡන්දදායකයන් පිරිසක් සිටින බව පෙන්වාදීම සඳහා ය. ඔවුන් 1977 සිට වර්ධනය වූ "පාදඩ ප්‍රභූ දේශපාලන සංස්කෘතියට" අකැමැති පිරිසකි. මෙවර එම "පාදඩ ප්‍රභූන්ට" ඡන්ද පාවිච්චි නොකළ 60 ලක්ෂයක ජනතාව ද අපගේ ඇගයීමට ලක් වේ. "පාදඩ ප්‍රභූන්ට" එරෙහිව ගොඩනැගෙන විරෝධය තුළ විකල්පය බවට හෙවත් "ගැලවුම්කාරයා" බවට ජාතික ජනබලවේගය පත්වන්නේ සුවිශේෂී ඓතිහාසික සාධකයක් නිසා බව තේරුම්ගැනීම ජනවරම නිවැරැදිව කියවා ගැනීම සඳහා ඉතා වැදගත් වේ. ජාතික ජන බලවේගය තෝරාගැනීම බවට පත්වන්නේ ජනතා විමුක්ති පෙරමුණ විසින් තම අතීත උරුමය, එනම් මහා කැපකිරීම් තුළින් නිර්මාණය කළ "සන්නාමය" පිළිබඳව ඇති ගෞරවය, ආදරය හා පිළිගැනීම නිසා බව සැඟවිය නොහැක.


342/1/4, ඊ. ඩබ්. පෙරේරා මාවත, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
342/1/4, E. W. Perera Mawatha, Kotte Road, Pitakotte.
දුරකථන: 0112 890670 /ෆැක්ස්: 0112 890671
E mail: jnpsrilanka1@gmail.com / Web: www.jnpsrilanka.lk

ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ නම් වූ සන්නාමයේ ගුණාංග නිර්මාණය කිරීම සඳහා ඓතිහාසිකව යම් භූමිකාවක් ඉටුකළ බලවේගයක් ලෙස, වර්තමාන ආණ්ඩුවේ ජනවරම ආරක්ෂා කිරීමට සහ විවිධ බාහිර බලපෑම් නිසා ආණ්ඩුව ඊට පිටුපා ක්‍රියාකිරීම වැළැක්වීමට වගකීමක් අප වෙත පැවරී ඇත. ඒ අනුව එම සන්නාමය නිර්මාණය කිරීමට, විශේෂයෙන්ම එම ක්‍රියාවලිය තුළ අපගේ මාතෘභූමිය බෙදා වෙන්කිරීම වැළැක්වීමට දිවිපිදූ රෝහණ විජේවීර සහෝදරයා ප්‍රමුඛ දහස් ගණන් වීරෝදාර සගයන්ට සාධාරණය ඉටුකිරීමට ආණ්ඩුවේ පාර්ශ්වවලට සමාන වගකීමක් අපට ද පැවරෙන බව අපගේ විශ්වාසයයි. නුදුරු අනාගතයේ දී ආණ්ඩුවට මුහුණදීමට සිදුවන දේශීය සහ විදේශීය බෙදුම්වාදී බලවේගවල බලපෑම්වලට සහ ගෝලීය භූ දේශපාලන කේන්ද්‍රයක් ලෙස ශ්‍රී ලංකාවට උරුම වී ඇති අභියෝගවලට මුහුණදීම පහසු නොවන බව ජනවරම නිර්මාණය කළ ජනතාව ද තේරුම්ගත යුතුය.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ජාත්‍යන්තර න්‍යාය පත්‍රයකට අනුව දියත් වූ මෙහෙයුමක් මගින් බලයෙන් පහකර ඔහු අත වූ "රිලේ බැටන් එක" රනිල් වික්‍රමසිංහ අතට ලබාදීමෙන් පසුව ඔහු විසින් 2002 දී සකස් කිරීම ආරම්භ කළ ධාවන පථය 2022 - 2024 කාලය තුළ කොන්ක්‍රීට් වැටවල් දමා ශක්තිමත් කරනු ලැබීය. දැන් "බැටන් පොල්ල" ජනතාව විසින් අනුර දිසානායක මහතා අතට ලබාදුන්න ද ඔහු ද දුවමින් සිටින්නේ එම පැරැණි ධාවන පථය තුළමය. දැන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඔවුන්ගේ බලපෑම මත සම්මත කළ අණපනත් සහ ඔවුන් විසින් ස්ථානගත කළ නිලධාරීන් ආදී පවුරු මගින් එම ධාවන පථය තවදුරටත් ආවරණය කර ඇත.

ඒ නිසා එම පථයෙන් එළියට පනිමින් ජනවරමට අදාළ අපේක්ෂා ඉටුකිරීම සඳහා "ඇතුළතින් තල්ලු කිරීම" සහ "පිටතින් ඇදීම" යන ක්‍රියාවලි දෙකම එකවිට සිදුවිය යුතු බව අපගේ විශ්වාසය වේ. එහිදී "තල්ලු කිරීමේ වගකීම" ජාතික ජන බලවේගයේ කේන්ද්‍රීය දේශපාලන බලවේගය වන ජනතා විමුක්ති පෙරමුණේ නායකයන්ට සහ සාමාජිකයන්ට පැවරෙන අතර, "ඇදීමේ භූමිකාව" ජනවරම නිර්මාණය කළ ජනතාවට මෙන්ම ශ්‍රී ලංකා රාජ්‍යය ආරක්ෂා කිරීමට කැපවන අප ඇතුළු සියලු ජාතික බලවේගවලට පැවරෙන බව අපගේ විශ්වාසයයි. ඊට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ වත්මන් දේශපාලන අභියෝග තුළ ආණ්ඩුව බිඳවැටීම අනිවාර්යෙන්ම රාජ්‍යයේ බිඳවැටීම දක්වා ගමන් කිරීමය.

ජනවරමේ අපේක්ෂා කියවා ගැනීම සහ ඊට අදාළ මහජන සංවාදය දැන් ඉතා වැදගත් වන්නේ ප්‍රධාන කරුණු දෙකක් නිසා බව අපි විශ්වාස කරමු. පළමුවැන්න, ඉහත සඳහන් කළ බරපතළ ආර්ථික සහ ගෝලීය භූ දේශපාලන අභියෝගයන් ය. බෙදුම්වාදී බලවේග විසින් 13 වැනි සංශෝධනය බලාත්මක කිරීම සඳහා කරනු ලබන බලපෑම්, ඉන්දියාව සමග රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා 2023 ජූලි 21 දින ඇතිකර ගත් එකඟතාවය අනුව ආර්ථික ඒකාබද්ධකරණ ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම සඳහා ඇති වන බලපෑම, ඉන්දු - පැසිෆික් කලාපයේ යුදමය අවශ්‍යතාව සඳහා ඇති කෙරෙන අමෙරිකානු බලපෑම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඇතිකරන බලපෑම් ආදී වශයෙන් වන බහුවිද බලපෑම් ඊට අයත් වේ. විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උවමනාවන්ට අනුව සම්මත කළ 2017 විදේශ විනිමය පනත සහ 2023 මහ බැංකු පනත නැවත සංශෝධනය කිරීමට ඉඩ නොදීම ආදිය ඉතා බරපතළ වේ. එම පනත් දෙක නැවත සංශෝධනය කිරීමෙන් තොරව ආර්ථික අර්බුදයෙන් දීර්ඝ කාලීනව ගොඩඒම යනු හුදු සිහිනයක් පමණක් බව අපගේ දේශපාලනික කියවා ගැනීම වේ.

එම පැහැදිලි කිරීමට අදාළ දෙවැනි කාරණය වන්නේ ජනවරම වැරදියට කියවා ගැනීම මගින් පැනවෙන මානසික බාධක ජය ගැනීමය. විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාව විසින් දෙමළ ජාතිවාදය සහ බෙදුම්වාදයට එරෙහිව නිර්මාණය කළ ජනවරම ඊනියා සිංහල ජාතිවාදය ප්‍රතික්ෂේප කිරීමක් ලෙස කියවා ගැනීමේ වරද ඉතා බරපතළ වේ. ඒ මගින් දෙමළ බෙදුම්වාදීන්ට පාර්ලිමේන්තුවේ ආසන අහිමි කළ සහ ඔවුන්ගේ ජාතිවාදී දේශපාලනය ප්‍රතික්ෂේප කළ ජනතාවගේ නාමයෙන් බෙදුම්වාදීන්ගේ ඉල්ලීම් ඉටුකර ගැනීමට අවකාශය සැලසේ. එය වළක්වාගත හැක්කේ උතුරේ සහ දකුණේ ජනතාවගේ අපේක්ෂා හෙවත් ජනවරම නිවැරදිව කියවා ගැනීම මගිනි.

විශේෂයෙන්ම 13 වැනි සංශෝධනය බලාත්මක කිරීම මගින් බෙදුම්වාදීන්ට පොලිස් බලය ලබාදීමෙන් සමාජ ආර්ථික පීඩනයට අමතරව කුල පීඩනයට ද ගොදුරුව සිටින අතිබහුතරයක් දෙමළ ජනතාවට සාධාරණය ඉටුවන්නේ නැත. ඒ මගින් සිදුවන්නේ එම ජනතාව තවදුරටත් පීඩාවට පත්වීම පමණකි. ඔවුන්ගේ පන්තියේ පුද්ගලයකු ජනාධිපති කරවීම මගින් ඔවුන් බලාපොරොත්තු වන්නේ ඔවුන්ව ආර්ථික සහ කුල පීඩනය ඇතුළු සමාජීය පීඩනයන්ගෙන් ගලවා ගැනීමය. ඒ සඳහා කළ යුතු දේ ලැයිස්තුගත කිරීම "රොකට් විද්‍යාවක්" නොවේ.

එහෙත් රටේ අවාසනාවකට ඒ සියල්ලට අදාළ "ප්‍රතිපත්තිමය බෙදීම හෙවත් සංවාදය" ජනාධිපතිවරණ සහ මහ මැතිවරණ ක්‍රියාවලිය තුළ සිදු නොවීය. එය සමාන වන්නේ ජනතාව විසින් ආණ්ඩුවට "හිස් චෙක් පතක්" අත්සන හා දිනය යෙදීමෙන් තොරව බාරදීම වැනි ක්‍රියාවකට ය. දේශපාලන සංවාදය තුළ එම "ප්‍රතිපත්තිමය බෙදීම" ඇති කිරීමට ආණ්ඩුවට විරුද්ධ විපක්ෂය මෙන්ම ආණ්ඩුවට මගපෙන්වන විපක්ෂය ද අසමත් වීම පිළිබඳව අපට ද වරද පැටවෙන බව නිහතමානීව පිළිගනිමු.

නමුත් ඉතිහාසය තුළ පක්ෂයක් ලෙස අප දේශපාලන තීන්දු ගැනීමේ දී පුද්ගලයන් ලෙස අපට ලැබෙන දේ හෝ අප ආණ්ඩුව තුළ නියෝජනය වනවාද, නැත්ද යන්න හෝ සාධකයක් ලෙස සැලකිල්ලට ගෙන නැත. ඒ අනුව අප පාර්ලිමේන්තුව තුළ නියෝජනය නොවීම අපගේ දේශපාලන භූමිකාව ඉටුකිරීම සඳහා බාධකයක් ලෙස නොසලකන බව පොදු මහජනතාවට දන්වා සිටිමු. එසේම ජනවරමේ අපේක්ෂා ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුවෙන් පිටත භූමිකාවට අදාළ "ප්‍රතිපත්තිමය බෙදීම හෙවත් සංවාදය" සඳහා පොදු මහජනතාවට ගෞරවයෙන් ආරාධනා කරමු.

මේ වගට,

(විමල් වීරවංශ)
නායක,
ජාතික නිදහස් පෙරමුණ.
(දේශපාලන මණ්ඩලය වෙනුවෙන්)
2024-11-20

පිටපත් :-
1. මහානායක හිමිවරුන් ප්‍රමුඛ මහා සංඝරත්නය
2. සියලුම දේශපාලන පක්ෂ